OL/2014/16/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

| | | |
|---|---|---|
| ඉස්ලාම් | I, II | පැය තුනයි |
| இஸ்லாம் | I, II | மூன்று மணித்தியாலம் |
| Islam | I, II | Three hours |

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ඉස්ලාමීය අකීදාවේ අන්තර්ගත අංගයක් වන 'අල්-උලූහියියාත්' යනු
   (1) නබිවරුන් පිළිබඳ කරුණු ය.
   (2) මලායිකාවරුන් පිළිබඳ කරුණු ය.
   (3) අල්ලාහ් පිළිබඳ කරුණු ය.
   (4) මතු දිවිය පිළිබඳ කරුණු ය.

2. ඉස්ලාමීය අකීදාව ආරක්ෂා කිරීමට වෙහෙස වූ ඉමාම්වරයකු වන්නේ
   (1) ඉමාම් අබුල් හසන් අල්–අෂ්අරී (රහ්) තුමා ය.
   (2) ඉමාම් අබූ හනීෆා (රහ්) තුමා ය.
   (3) ඉමාම් ෂුහ්රි (රහ්) තුමා ය.
   (4) ඉමාම් ෂව්කානි (රහ්) තුමා ය.

3. 'රිද්දත්' යනු
   (1) අල්ලාහ්ට සම කිරීම ය.
   (2) ආගම වෙනස් කිරීම ය.
   (3) ප්‍රතික්ෂේප කිරීම ය.
   (4) වංචනික ක්‍රියා ය.

4. 'කුල්ලතෙන්' ජලය යනු
   (1) ලීටර 310 ට වඩා වැඩි ජලයයි.
   (2) ලීටර 260 ට වඩා වැඩි ජලයයි.
   (3) ලීටර 240 ට වඩා වැඩි ජලයයි.
   (4) ලීටර 210 ට වඩා වැඩි ජලයයි.

5. සලාතයේ දී අනිවාර්යයෙන් ම උසුරිය යුතු වන්නේ
   (1) ෆාතිහා සූරාව ය. (2) වජ්ජහත් ය. (3) කුනූත් ය. (4) තස්බීහ් ය.

6. සුන්නත් වූ සවුම සමාදන් වීමට සුදුසු දවස් වනුයේ
   (1) සඳුදා සහ බ්‍රහස්පතින්දා ය.
   (2) බදාදා සහ බ්‍රහස්පතින්දා ය.
   (3) බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ය.
   (4) ඉරිදා සහ සඳුදා ය.

7. අනිවාර්යයෙන් ම ජමා අත් සමග ඉටු කළ යුතු සලාතය වනුයේ
   (1) ඊද් දින සලාතයයි. (2) ජුම් ආ සලාතයයි. (3) විත්ර් සලාතයයි. (4) පස්වේල් සලාතයයි.

8. හජ් වන්දනාව අනිවාර්ය වගකීමක් කළ වසර
   (1) හිජ්රි දෙක ය. (2) හිජ්රි තුන ය. (3) හිජ්රි හතර ය. (4) හිජ්රි හය ය.

9. එළුවන්ට සකාත් නියම වීමට නම්, යමෙකු සතුව සිටිය යුතු එළුවන් සංඛ්‍යාව
   (1) 10 කි. (2) 20 කි. (3) 25 කි. (4) 40 කි.

10. හජ් හා උම්රාව අතර ඇති ප්‍රධාන වෙනස
   (1) තවාෆ් කිරීමයි.
   (2) අරෆාවේ රැඳී සිටීමයි.
   (3) ජම්රාවල දී ගල් ගැසීමයි.
   (4) සඈයු ඉටු කිරීමයි.

[ දෙවැනි පිටුව බලන්න

11. රුකූඋ හෝ සුජූද් **නොමැති** සලාතය
    (1) ග්‍රහණ අවස්ථාවේ ඉටු කරන සලාතය වේ. (2) ඊද් සලාතය වේ.
    (3) ලුහා සලාතය වේ. (4) ජනාසා සලාතය වේ.

12. දීර්ඝ ගමනක යෙදෙන අයකු ලුහර් හා අසර් යන සලාත දෙක එක්කොට ලුහර් වේලාවේ දී සලාතයේ යෙදීම
    (1) ජෙම්උ නම් වේ. (2) ජෙම්උ තක්දිම් නම් වේ.
    (3) කස්ර් නම් වේ. (4) ජෙම්උ තෑහීර් නම් වේ.

13. යමෙකු තම බිරිඳ, එකවරම තලාක් තුනම උසුරා දික්කසාද කිරීම
    (1) තලාක් බිදඉයි නම් වේ. (2) තලාක් සුන්නි නම් වේ.
    (3) තලාක් රජ්ඊ නම් වේ. (4) ෆස්කු නම් වේ.

14. "සැමියා බිරිඳගේ පොරවනය ද බිරිඳ සැමියාගේ පොරවනය ද වන්නාහ." මෙය
    (1) නබි වදනකි. (2) කුර්ආන් වාක්‍යයකි.
    (3) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) ගේ ප්‍රකාශයකි. (4) අබුබක්ර් (රළි) තුමාගේ ප්‍රකාශයකි.

15. මරණයට පත් වූ අයෙකුගේ දේපළ ඥාතීන් අතර බෙදා දීම ගැන පහදා දෙන කලාව
    (1) ඉල්මුල් හදීස් ය. (2) ඉල්මුල් කලාම් ය. (3) ඉල්මුල් මීරාස් ය. (4) ඉල්මුල් ෆික්හ් ය.

16. පහත දැක්වෙන **X** හා **Y** තීරුවල ඇති වචන සලකා බලන්න.

| **X තීරුව** | **Y තීරුව** |
|---|---|
| (i) – අකීදාව | A – සලාතය |
| (ii) – ඉබාදා | B – වෙළඳාම |
| (iii) – මුආමලාත් | C – තලාක් |
| (iv) – මුනාකහාත් | D – ඊමාන් |

ඉහත **Y** තීරුවේ වචන **X** තීරුවේ වචනවලට අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර දැක්වෙන වරණය තෝරන්න.
    (1) A C B D (2) C B D A (3) D A B C (4) D A C B

17. 'අල්-ඉමාමුල් ඇලම්' යන සුවිශේෂ නමින් හඳුන්වනු ලබන ඉමාම්වරයා
    (1) ඉමාම් දබරී (රහ්) තුමා ය. (2) ඉමාම් මාලික් (රහ්) තුමා ය.
    (3) ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා ය. (4) ඉමාම් අබූ හනීෆා (රහ්) තුමා ය.

18. පහත සඳහන් කණ්ඩායම් අතුරෙන් ෘසකාත් ලැබීමට සුදුසුකම් **නොලබන** කණ්ඩායම වනුයේ
    (1) දුගීන් ය. (2) ණයකරුවන් ය.
    (3) මිස්කීන් ය. (4) නබි (සල්) තුමාගේ පවුලේ අය ය.

19. 'තස්කියා' යන අරාබි වචනයේ තේරුම
    (1) දේව බැති බිය යන්න ය. (2) චිත්ත පාරිශුද්ධත්වය යන්න ය.
    (3) කැපවීම යන්න ය. (4) පව් සමාව යන්න ය.

20. පතිවත සුරැකි කාන්තාවකට අපහාසාත්මකව දොස් කීමට හිමිවන දඬුවම
    (1) කස පහර 40 කි. (2) කස පහර 80 කි.
    (3) කස පහර 100 කි. (4) රටින් පිටමං කිරීමයි.

21. ඉස්ලාමීය නීති මූලාශ්‍රවලින් **තෙවන** ස්ථානය ගනුයේ
    (1) අල්-කුර්ආනය ය. (2) සුන්නාව ය.
    (3) සහබාවරුන්ගේ මත වේ. (4) ඉජ්මා ය.

22. පහත හදීස් ග්‍රන්ථ අතුරෙන් 'සිහාහුස් සිත්තා' හි ඇතුළත් **නොවන්නේ**
    (1) මුඅත්තා ය. (2) ජාමිඋද් තිර්මිදි ය. (3) සුනන් අබීදාවූද් ය. (4) සහීහ් මුස්ලිම් ය.

23. නබි (සල්) තුමා අවසාන මහා දේශනය පැවැත්වූයේ
    (1) හිරා කඳු පාමුල ය. (2) සව්ර් කඳු පාමුල ය. (3) උහද් කඳු පාමුල ය. (4) අරෆා පිටියේ ය.

24. ශ්‍රී ලංකාවේ වාසය කරන මුස්ලිම්වරුන්ගෙන් වැඩිදෙනෙකු පිළිපදින මද්හබය
    (1) හනෆි මද්හබයයි. (2) ෂාෆිඊ මද්හබයයි. (3) මාලිකි මද්හබයයි. (4) ලාහිරි මද්හබයයි.

25. බද්ර් යුද්ධයට සහභාගී වූ මුස්ලිම් **නොවන** (කාෆිර්) අයගේ සංඛ්‍යාව
(1) 1 000 කි. (2) 2 000 කි. (3) 3 000 කි. (4) 6 000 කි.

26. කුලෆා උර් රාෂිදූන්වරුන්ගෙන් පසුව ඉස්ලාමීය රාජ්‍ය පාලනය බාරගත්තේ
(1) ෆාත්තිමීවරුන් ය. (2) උමයියාවරුන් ය. (3) අබ්බාසිවරුන් ය. (4) සබවිවරුන් ය.

27. මස්ජිදුන් හරාම්හි සිට මස්ජිදුල් අක්සා දක්වා වූ රාත්‍රී ගමන
(1) මිහ්රාජ් නම් වේ. (2) හිජ්රත් නම් වේ. (3) ඉස්රාඋ නම් වේ. (4) කස්වත් නම් වේ.

28. තහනම් කර ඇති ඉපැයීමේ ක්‍රමයක් වන්නේ
(1) කර්මාන්ත ය. (2) පොලියට දීම ය. (3) කෘෂිකර්මාන්තය ය. (4) ඉජාරාහ් ය.

29. මළ අයගේ දේපළවලින් පළමුව ඉටු කළ යුත්තේ
(1) මළ අයට අදාළ වගකීම් ය. (2) ණය ගෙවා දැමීම ය.
(3) වරාසත් ය. (4) වසිය්යත් ය.

30. පළමුවරට මුහම්මද් නබි (සල්) තුමාට වහී පහළ වූ ස්ථානය
(1) හිරා ගුහාව ය. (2) කෘබාව ය. (3) තෞර් ගුහාව ය. (4) මස්ජිදුන් නබවි ය.

31. ස්ථිර මහ්රම්වරුන්ගෙන් කෙනෙකු වනුයේ
(1) බිරිඳගේ සොහොයුරිය ය. (2) තලාක් පැවසූ කාන්තාව ය.
(3) නැන්දාගේ දියණිය ය. (4) පියාගේ මව ය.

32. පිරිමින් රිදී ආභරණ පැලඳීම පිළිබඳ ආගමික නීතිය
(1) ජායිස් ය. (2) හරාම් ය. (3) සුන්නත් ය. (4) මක්රූහ් ය.

33. විසඳුමක් නොමැති ප්‍රශ්නයකට කුර්ආන් හා හදීස් පදනමින් විසඳුම් සෙවීම
(1) ඉල්හාම් නම් වේ. (2) කරාමත් නම් වේ. (3) ඉජ්තිහාද් නම් වේ. (4) උර්ෆු නම් වේ.

34. හජ් දින උත්සවය පවත්වන්නේ දුල්හජ් මාසයේ කීවැනි පුර දිනයේ දී ද?
(1) දෙවන පුර දිනයේ දී (2) පස්වන පුර දිනයේ දී
(3) දහවන පුර දිනයේ දී (4) දොළොස්වන පුර දිනයේ දී

35. ඉමාම් තිර්මිදි (රහ්) තුමා උපන් ස්ථානය
(1) කුරාසාන් ය. (2) සමර්කන්ද් ය. (3) ගාසා ය. (4) තිර්මිදි ය.

36. "විශ්වාසවන්තයෙනි! ඔබගෙන් අයෙක් අන් අයකුගේ දේපළ අසාධාරණ ලෙස අනුභව නොකරන්න." මෙය
(1) අල්-කුර්ආනයේ වාක්‍යයකි. (2) නබි (සල්) තුමාගේ කියමනකි.
(3) සහාබිවරයකුගේ කියමනකි. (4) ඉමාම්වරයකුගේ කියමනකි.

37. හුදයිබිය්යා ගිවිසුම ඇති කර ගත් වසර
(1) හිජ්රි හතර වේ. (2) හිජ්රි හය වේ. (3) හිජ්රි අට වේ. (4) හිජ්රි නවය වේ.

38. නබි (සල්) තුමා අවසාන වශයෙන් හජ් වන්දනාව ඉටු කළ වසර
(1) හිජ්රි හතර වේ. (2) හිජ්රි හය වේ. (3) හිජ්රි හත වේ. (4) හිජ්රි දහය වේ.

39. නවීන වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස හඳුන්වන ඉස්ලාමීය විද්වතා
(1) අර්-රාසි ය. (2) ඉබ්නු අව්වාම් ය. (3) අලි ඉබ්නු සීනා ය. (4) අබුල් අබ්බාස් ය.

40. 'කිතාබුල් මුක්තසර් ෆී හිසාබ් අල් ජබ්ර් වල්මුකාබලා' නම් ග්‍රන්ථයේ කර්තෘ
(1) ඉබ්නු හයිතම් ය. (2) අල්-කුවාරිස්මී ය. (3) අල්-කින්දි ය. (4) අල්-බදානි ය.

**

[ හතරවෙනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) ඉස්ලාමීය අකීදාවට **පටහැනි** කණ්ඩායම් **දෙක** සඳහන් කරන්න.
(ii) සලාතයේ ෆර්ළ් **හතරක්** සඳහන් කරන්න.
(iii) විවාහයක් නීත්‍යානුකූල වීමට අවශ්‍ය කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(iv) සුන්නත් වූ සවුම් **දෙකක්** සඳහන් කරන්න.
(v) හවුල් වෙළඳාමේ වාසි **දෙකක්** ලියන්න.
(vi) හදීස් ක්ෂේත්‍රයට දායකත්වය දැක්වූ ඉමාම්වරුන් **දෙදෙනකු** නම් කරන්න.
(vii) ඊමාන්හි කොටස් **දෙක** මොනවා ද?
(viii) 'උලුහියයා' යනු කුමක් ද?
(ix) ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා විසින් රචිත ග්‍රන්ථ **දෙකක** නම් ලියන්න.
(x) ඉස්ලාම් ලබා දී ඇති මිනිස් අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) ෂිර්ක් වර්ග **දෙක** සඳහන් කර, ඒවාට උදාහරණ දෙන්න.
(ii) ඊමානය මුස්ලිම්වරයකුගේ ජීවිතයේ ඇති කරන බලපෑම් **තුනක්** ලියන්න.
(iii) සලාතය නොසලකා හැරීම නිසා ඇතිවන විපාක **පහක්** සඳහන් කරන්න.

**3.** (i) 'හුකූකුල් ඉබාද්' යන්නට උදාහරණ **දෙකක්** දක්වන්න.
(ii) ජලයේ ආකාර **තුන** සඳහන් කර, ඒවාට උදාහරණයක් බැගින් ඉදිරිපත් කරන්න.
(iii) ඉස්ලාම් පිරිමින්ට තහනම් කර ඇති ඇඳුම් ආයිත්තම් හා ගැහැනුන්ට තහනම් කර ඇති ඇඳුම් ආයිත්තම් මොනවා දැ'යි දක්වන්න.

**4.** (i) 'මහර්' යනු කුමක් ද?
(ii) දික්කසාද ක්‍රම **තුනක්** සඳහන් කරන්න.
(iii) ස්වාමියා විසින් භාර්යාව වෙත ඉටු කළ යුතු යුතුකම් **පහක්** සඳහන් කරන්න.

**5.** (i) කලීෆා අබුබක්ර් (රළි) තුමා තම පාලන කාලයේ මුහුණ දුන් ප්‍රධාන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
(ii) චිත්ත සමනයට ඉස්ලාම් පෙන්වා දී ඇති මාර්ගෝපායන් **තුනක්** සඳහන් කරන්න.
(iii) මක්කා ජයග්‍රහණය ගැන කෙටියෙන් විස්තර කරන්න.

**6.** (i) 'කියාස්' යනු කුමක් ද?
(ii) දෙමව්පියන් දරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් **තුනක්** සඳහන් කරන්න.
(iii) අපරාධ සිදු නොවන පරිසරයක් බිහි කිරීම සඳහා ඉස්ලාම් පෙන්වා දී ඇති ක්‍රමෝපායන් **පහක්** සඳහන් කරන්න.

**7.** (i) අබ්බාසිය කලීෆාවරුන් **දෙදෙනෙකු** නම් කරන්න.
(ii) කලීෆා අබ්දුල් මලික් තුමා ඉටු කළ ප්‍රතිසංස්කරණ කටයුතු **තුනක්** සඳහන් කරන්න.
(iii) අරාබිය හා ශ්‍රී ලංකාව අතර පැවති සම්බන්ධතා කෙටියෙන් විස්තර කරන්න.

PAST PAPERS WIKI

***